#MediaethicsSL #SinhalaPress #Ika #Mawbima #Divaina #Ada

ධර්මචක්‍රයක රූපය රැගත් ගවුමක් හැඳ පාරේ ගිය බවට චෝදනා ඉදිරිපත් කොට කාන්තාවක් අත් අඩංගුවට ගැනීමේ ප්‍රවෘත්තිය පසුගිය දිනවල ජනමාධ්‍ය ඔස්සේ මෙන්ම සමාජ මාධ්‍ය ඔස්සේද ජනප්‍රියට පත්විණි. මෙම ප්‍රවෘත්තිය ජනප්‍රිය වීමට ප්‍රධානතම හේතුව වූයේ, සැබවින්ම එම වස්ත්‍රයේ ඇත්තේ ධර්ම චක්‍රයක් නොව නැවක සුක්කානමක රූපයක් වීම නිසාවෙනි. මෙහිදී නිරීක්ෂණය කළ හැකි වූයේ මෙම කාන්තාවගේ නම ඇතුළු පුද්ගලික තොරතුරු බොහෝ පුවත් වාර්තාවන් ඔස්සේ අනාවරණය වී තිබීමයි. නමුත් ඇය නීතිය ඉදිරියේ වරදකාරියක වී නොමැති අතර, තවමත් සැකකාරියක පමණක් වේ. මෙය මාධ්‍ය ආචාරධාර්මික කෝණයකින් බැලූ විට වුවද කිසිසේත්ම අනුමත කළ නොහැකි බව අපට පැවසිය හැක. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?